අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක : 43/2019(I)

මගේ අංක: ED/4/58/01/05/93(IV)
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල
2021 පෙබරවාරි මස 19 වන දින

සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
විභාග කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

<u>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2141/6 හා 2019.09.16 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ඇතුලත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් 2019.10.16 දිනැතිව නිකුත් කරන ලද අධ්‍යාපන අමාත්‍යාංශ 43/2019 චක්‍රලේඛයේ දෙවන ඡේදය යටතේ වන 2.1.(ආ) වගන්තියෙහි සටහන 03 පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

"සටහන 03 - නව සේවා ව්‍යවස්ථාව නිකුත් කරන ලද 2015.08.21 දිනට පෙර II වන කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ යුතු නියමිත දිනය එළඹ ඇති නිලධාරීන්, 2015.08.21 දිනට පෙර එම සුදුසුකම සපුරා ඇත්නම් හෝ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇත්නම්, එම නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාවේ 10.2.1හි අනු අංක (II) යටතේ වන II වන කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කරන ලද නිලධාරීන් ලෙස සලකනු ලැබේ"

මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය අනුව නිකුත් කරනු ලැබේ.

මහාචාර්ය කේ. කපිල. සී. කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය